**අකුරණ ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

අකුරණ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී සභාවේ ගොඩනැගිලි සංවර්ධනයට දරා තිබූ රු.345,000 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් සංවර්ධනයට වැය කල මුදල් ප්‍රාග්ධනිත කළ යුතු බව. |
| (ආ) | කිසිදු ගිවිසුමකට එළඹීමකින් තොරව සහ සමාලෝචිත වර්ෂය තුළදී ඉටු නොකල රු.1,903,800 ක් වටිනා ව්‍යාපෘතීන් කර්මාන්ත ණය හිමියන් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ගිණුම හා ප්‍රාග්ධන වියදම් ගිණුම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉටු නොකල හෝ ගිවිසුම්වලට හෝ එළඹ නොමැති ව්‍යාපෘතිවල වටිනාකම් ප්‍රාග්ධනිත නොකල යුතු බව. |
| (ඇ) | තක්සේරු වටිනාකම රු.2,683,000 ක් වූ අම්බලම්වත්ත ඉඩමේ ඉදිකර ඇති කාමර 5 හි ගොඩනැගිල්ල ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර, මෙම ඉඩමේ පිහිටි ආයුර්වේද ගොඩනැගිල්ල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අයිතිය නිරවුල් වූ පසුව මෙම ඉඩමේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කල යුතු බව. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළව මූලා ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.229,694,470 ක් වූ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන රු.229,586,239 ක්වූ ශේෂයන් අතර රු.325,713 ක වෙනසක් විය. | නිවැරදි ජර්නල් සටහන් මඟින් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු බව. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය | 2020 වර්ෂයේ සැප්තැම්බර් 15 දින වන විට වාර්තා වී තිබූ අනවසර ඉදිකිරීම් 25 කින් අනවසර ඉදිකිරීම් 10 ක් සම්බන්ධයෙන් පමණක් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | සියලු අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු බව. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2013 ජූලි 31 දිනැති අංක 07 දරන චක්‍රලේඛ | 2020 වර්ෂය වන විට ප්‍රාදේශීය සභාව විසින් ත්‍රීරෝද රථ නැවතුම්පල 29 ක ත්‍රීරෝද රථ 570 ක් ලියාපදිංචි කර තිබූ අතර එමඟින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,543,000 ක් වූ හිඟ වාර්ෂික ගාස්තු අයකර ගත යුතුව තිබුණි. | වාර්ෂික ගාස්තු වශයෙන් රු.514,400 ක් අය කර ඇති බව. | ලියාපදිංචි කර ඇති සියලු ත්‍රීරෝද රථවලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු බව. |
| (ඇ) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම "අ" හි 1.4 (ඇ) ඡේදය | සභාව වෙත 2020 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට ලැබී තිබුණු මහජන පැමිණිලි 64 කින් 15 සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා මාර්ග ගැනීමක් හෝ පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි. | කොවිඩ් අවධානම් තත්වය මත ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමේ ප්‍රමාදය මත මෙම තත්ත්වය උද්ගත වූ බව. | සභාව වෙත ලැබෙන මහජන පැමිණිලි සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,626,331 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,384,678 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ පිහිටි පෞද්ගලික ආයතන දෙකකින් නීතිමය වශයෙන් සත්‍ය ලෙස පිළියෙල කළ, සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන කට්ටලය වෙනුවට සාවද්‍ය ලෙස පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පිළිවෙලින් රු.206,225 ක් සහ රු.9,648 ක් පමණක් බදු ලෙස අයකර ගෙන තිබුණි. | සංචාරක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද තහවුරු කල වාර්ෂික වාර්තාවෙන් පිටපතක් හා සංචාරක මණ්ඩලය වෙත ඉදිරිපත් කල වාර්ෂික ගිණුම් වාර්තා සනාථ කර දෙන මෙන් ඉල්ලීම් කල නමුත් එම වාර්තා සනාථ කර නොදුන් බැවින් අදාල ආයතනයන් ප්‍රාදේශීය සභාව වෙත ලබාදුන් මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් සියයට 1 ක බද්ධ අය කර ගැනීමට කටයුතු කල බව. | සත්‍ය මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට හා ඒවා සත්‍ය බවට තහවුරු කර ගැනීමට කටයුතු කර නිවැරදි බදු ආදායම අයකර ගැනීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | සභාව විසින් සංවර්ධන කටයුතු කිරීමේදී එයට අදාළ නිවැරදි ඵලදායී ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම මත විවිධ පාර්ශවයන් විසින් දමා තිබූ නඩු කටයුතු 09 ක් සඳහා 2004 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා රු.414,650 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | අධිකරණ කටයුතු අවසන් කිරීමේ ප්‍රවේශයන්ට එළඹ ඇති බව. | නීති, රීති වලට අනුකූලව කටයුතු කිරීම හා ඵලදායී ශක්‍යතා අධ්‍යයනයක් මඟින් සංවර්ධන කටයුතු සිදුකල යුතු බව. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1991 දෙසැම්බර් 04 දින පෞද්ගලික පාර්ශවයක් විසින් පවරා දුන් ඉඩමක් නීත්‍යානුකූල ලෙස විධිමත්ව පවරා ගැනීමෙන් තොරව හා සැලසුම් අනුමත කර නොගෙන සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන වැයකර ආයුර්වේද ගොඩනැගිල්ලක් හා තක්සේරු වටිනාකම රු.2,683,000 ක් වූ කඩ කාමර 5 ක් සභාව විසින් ඉදිකර තිබුණි. | විධිමත් පවරා ගැනීමක් සිදු වී නොමැති බව පිලිගන්නා බව. | නීත්‍යානුකූලව ඉඩම පවරා ගෙන හා සැලසුම් අනුමත කරගෙන ඉදිකිරීම් සිදුකළ යුතු බව. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 84 ක් වූ අතර අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී සේවක අතිරික්තතා 02 ක් හා සේවක ඌනතා 25 ක් වූ අතර, එකී ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පුරප්පාඩු වූ තනතුරු දෙකක් සම්පූර්ණ වී ඇති බවත්, තනතුරු 04 ක පුරප්පාඩු පුරවන ලෙස අදාළ ආයතනයන් වෙත දන්වා යවා ඇති බවත් බඳවාගත යුතු අනෙකුත් තනතුරු බඳවාගැනීම් කටයුතු ක්‍රියාත්මක කර ඇති බව හා අතිරික්ත සේවකයින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පත්වීම් ලබාගත් අයවලුන් බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම හා අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු බව. |